| | |
|---|---|
| | m) අවශ්‍යතා උපලේඛනයේ (IV කොටසේ) අංක 5 ලැයිස්තුවේ, දක්වා ඇති තොරතුරුවලට අනුව ගණනය කර වාර්ෂික ශ්‍රම පිරිවැය ඉදිරිපත් කළ යුතුය. එම ලැයිස්තුවෙහි දැක්වෙන වැටුප් හා අතිකාල ගණනය කළ ආකාරයට වඩා බැහැරව යම් ලංසුකරුවෙකු ඉදිරිපත් කරන වැටුප් හා අතිකාල ප්‍රමාණ ඉක්ම වන්නේ නම් එම වැටුප් හා අතිකාල ගණනය කළ ආකාරය ලංසුකරු විසින් සහතික කර ඉදිරිපත් කළ යුතුය.<br>n) VAT බදු ලියාපදංචි සහතිකයේ පිටපතක් (VAT බදුවලින් නිදහස් කර තිබේ නම් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවෙන් ලබාගත් ලිපියක්) සමඟ 2023/2024 තක්සේරු වර්ෂයේ VAT බදුගෙවීම් පිළිබඳ වැට් බදු නිශ්කාෂණ සහතික පිටපත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරියකු විසින් සහතික කර ඉදිරිපත් කළ යුතුය.<br>o) ලංසුව ඉදිරිපත් කරනු ලබන්නේ හවුල් ව්‍යාපාර නාමයකින් හෝ සමාගම් පනත යටතේ ලියාපදිංචි සමාගමකින් නම්, ලංසු අයදුම්පත, ලංසු කොන්දේසි, ගිවිසුම ඇතුළු මෙම ප්‍රසම්පාදනයට අදාළ සියලු කටයුතු සඳහා වන බලය පැවරීමේ ලේඛනයක්<br>p) පසුගිය වර්ෂවල රෝහල්වල/ආයතනවල පිරිසිදු කිරීමේ සේවා කටයුතු ඉටු කිරීමේදී ලංසුකරු සම්බන්ධයෙන් ලැබී ඇති සේවා වාර්තා<br>q) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සන්නද්ධ සේවාවෙන් නීත්‍යානුකූල නොවන පරිදි සේවය හැරගිය පුද්ගලයින් සේවයේ යොදවා නොමැති බවට දිවුරුම් ප්‍රකාශයක් ලංසුකරු විසින් ඉදිරිපත් කළ යුතුය.<br>r) මෙම කොන්ත්‍රාත්තුවට අදාළ කාර්ය මණ්ඩලය සපයා ගැනීමට ඇති හැකියාව ඇති බවට ලංසුකරුගේ දිවුරුම් ප්‍රකාශයක්.<br>s) ආයතනයේ ක්‍රියාත්මක වන ඵලදායිතා සහ වර්තමානයේ ක්‍රියාත්මක වන ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන සඳහා සහයෝගය ලබාදෙමින් පිරිසිදු කිරීමේ සේවාව සපයන බවට ලංසුකරුගේ ප්‍රකාශයක්<br>t) ලංසු ආකෘති පත්‍රවල (III කොටසේ) සඳහන් කාර්යය මණ්ඩල විස්තරය<br>u) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.5 (ඇ) පරිදි දිවුරුම් ප්‍රකාශය (පිටු අංක 58) |
| ITB 15.1 | ලංසුකරු විසින් සියලු වියදම් ශ්‍රී ලංකා රුපියල් වලින් දැක්විය යුතුය. |
| ITB 19.1 | ලංසුවේ වලංගු කාලය, ලංසු විවෘත කරන දින සිට දින 91ක් දක්වා වලංගු විය යුතුය. |
| ITB 20.1 | ලංසු ආකෘති පත්‍රවල III කොටසෙහි ඇතුලත් ආකෘති පත්‍රය ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති වාණිජ බැංකුවකින් නිකුත් කරන ලද ලංසු සුරැකුමක් ඇතුළත් විය යුතුය. මෙම ලංසු සුරැකුම මුදල් ඇපකරයක් මගින්ද ඉදිරිපත් කළ හැක. ලංසු සුරක්ෂණය **අධ්‍යක්ෂ, ශික්ෂණ රෝහල, පේරාදෙණිය** නමට ඉදිරිපත් කල යුතුය. |
| ITB 20.2 | ලංසු සුරක්ෂණය **රු. 77,000.00** ක වටිනාකමින් යුක්ත විය යුතුය.<br><br>ලංසු සුරක්ෂණයේ වලංගු කාලය **2025.04.17** දින සිට **2025.07.30** දින දක්වා විය යුතුය. |
| | **D. ලංසු ඉදිරිපත් කිරීම සහ විවෘත කිරීම** |
| ITB 22.2 | ඇතුළත සහ පිටත ලියුම් කවර වල ආයතනයේ නම සහ ප්‍රසම්පාදන අංකය සටහන් කළ යුතුය. |
| ITB 23 | ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන දිනය: **2025.04.17**<br>වේලාව: **පෙ.ව 10.30** |